
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
E N G L A N D

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

*කර්තෘ* : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
*පරිගණක කටයුතු* : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
*ඡායාරූප* : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## මර්වින් ගුටිකෑමෙන් පසු.......

**මෙ**පමණ කල් කටමැත දෙඩූ කම්කරු ඇමති මර්වින් සිල්වා මුහුණෙන් කටින් ලේ පෙරාගෙන කාර් එකක් තුළ ගුළිවී සිටින පින්තූර රැසක් වෙබ් අඩවි හරහා යුරෝපයට ආවේය. සායම් භාජනයක වැටුණු නරියා සිහි ගන්වන තවත් රූපයක වූයේ ඔහුගේ ඔලුවට රෝසපාට සායම් ටින් එකක් රූපවාහිනිය තුළදී කිසිවෙකු විසින් හැලීමෙන් ඔහුගේ ඔලුවෙන් ලේ ගලන පෙනුම තවත් භයානක ස්වරූපයක් ගන්වා තිබීමයි. තවත් කවුදෝ කෙනෙක් මල් පැලය පිටින් ම මැටි මල් පෝච්චියක් උඩක සිට එල්ලය බලා ඔහුගේ හිස මතට අතහරින ලද බවට ද විස්තර විය. මේ සියල්ලෙන් මර්වින් සිල්වා පාඩමක් ඉගෙන ගත්තේයයි අපට කිසිසේත් නොහැඟෙයි. මක්නිසාද ඔහුට උද්දච්චකම මිස මොළයක් නැති නිසාය. එය වෙනම කාරණයකි. මෙහි ලියන්නට සිතුනේ මර්වින් සිල්වා ගේ ගුටිකෑමේ අනඝීත්වය ගැන නොව ඒ හුට පටය නිසා ප්‍රකටව පෙනුණ ඇතැම් අසුබ කාරණා රැසක් පිළිබඳව ය.

මර්වින් කළ කළබලය සහ පහරදීම් ගැන ආරංචිවූ වහාම එතැනට දුවගෙන ආවේ සිරස රූපවාහිනී කැමරා ඒකකය සහ වෙනත් පත්‍රවාර්තාකරුවන් හා කැමරාකරුවන්ය. ඔව්හු සිදුවූ හැම දෙයක්ම රූප ගතකර ලංකාවටද ලෝකයටද දැනගන්ට සැළැස්වූහ. රජයේ ප්‍රධාන මාධ්‍ය ආයතන දෙක රූපවාහිනිය හා ගුවන්විදුලි සංස්ථාවයි. ලංකාවේ ත්‍රස්තවාදය පටන්ගත් දා සිටම මේ ස්ථාන ත්‍රස්තවාදීන්ගේ ප්‍රධාන ඉලක්ක දෙකක් නිසා දැඩි ආරක්ෂාව පණවා ඇත. දැනුදු ඒ තැන් වලට ඇතුල් විය හැක්කේ දැඩි සෝදිසියට හා පරීක්ෂාවට ලක්වීමෙන් පසුව ය. එහෙත් එදා කොපමණ ආරක්ෂක භටයින් සිටියත් පිටස්තර අය සිය ගණනක් ඉතා ලෙහෙසියෙන් රූපවාහිනිය තුළට පිවිස මර්වින්ට ද ඔහුගේ තගාලාට ද කළ ගුටි සංග්‍රහය රූපගත කළෝ ය. එසේ නම් එවැනි අවස්ථාවක කොටියන්ටද ඇතුළට රිංගන්නට බැරිකමක් නැත. ඒ පෙන්නුම් කළේ සමස්ථයක් හැටියට දැනට මුලු ලංකාවේ ම පවතින දුර්වල ආරක්ෂක තත්වයයි.

මර්වින් සිල්වා තඹ සතේකට වැඩක් නැති, රටක තියා අපායටවත් බාර නොගන්නා මහා නරුමයෙකු බව සැබෑය. එහෙත් ඔහු ශ්‍රී ලංකාවේ කම්කරු ඇමති ය. මර්වින් සිල්වා කවුදැයි ලෝකයේ කිසිවෙකු නොදන්නා නමුත් ලංකාවේ කම්කරු ඇමතිට ජනතාව වට වී මුහුණෙන් කටෙන් ලේ එනතුරු පහරදුන් බව නම් දැන් ලෝකයාම දනී. එය කිසිසේත් හොඳ සැටිපිකට් එකක් නොවේ. ලංකාවේ නීතිය සහ අණ කඩා වැටී ඇති බව ඉන් පැහැදිලි විය. කොටි ත්‍රස්තවාදීන් ඇතුලු ලංකාවට සතුරු නෝර්වේ ආදී රටවල් ප්‍රචාරය කරමින් සිටියේ ද එයයි. මාධ්‍යය ලත් ජයග්‍රහණයක් ලෙස පෙන්නුවද සිරසට හා මහාරාජලාටද අවශ්‍ය වූයේත් එයයි. මර්වින් ගුටි කෑවේය. තෙල් ගා පත්තු බැඳ රිදුම එතනින් ඉවරය. එහෙත් අප රටට වූ අපකීර්තිය එසේ මැකී යන්නේ නැත. මර්වින් වැනි කුම්භාණ්ඩයින් ලංකරගත් විට වන විනාසය බලි ඇරලාවත් මකාගත නොහැකි බව අපේ නායකයින් දැනගත යුතුය.

# අධර්මය දුරු කළ දුරුත්ත

**දු**රුත්ත යන්න භෞගෝලීය වශයෙන් හා ඓතිහාසික වශයෙන් යයි ප්‍රධාන ලෙස දෙයාකාරයකට අර්ථනිරූපණය කරන්න පුළුවන්. භෞගෝලීය වශයෙන් බලන කල ශ්‍රීලංකාවට ඉතාමත්ම දුරින් ඉර ගමන් කරන්නෙ සාමාන්‍යයෙන් දෙසැම්බර් මැද භාගයේ සිට ජනවාරි මැද භාගය දක්වා කාල සීමාවට ගැනෙන දුරුතු මාසයේ දී යි. ඒ නිසා දුරුතු මාසයට වැටෙන දෙසැම්බර් 22 දා ඉර ගමන්කරන්නෙ නිරක්ෂයට අංශක 23 ½ ක් දකුණින් පිහිටි මකර නිවර්තනයට ලම්භාකාරව ඕස්ට්‍රේලියාව හරහායි.

පුරාවෘත්තගත ඓතිහාසික වාර්තා අනුව බුදුහිමියන් ප්‍රථම වරට සිරිලක් බිමට වැඩමකර ලක්බිමින් අධර්ම බලය දුරු කර ශ්‍රී සද්ධර්ම බලය ස්ථාපනය කළේ බුද්ධත්වයෙන් නම මාසයකට පසු උදා වූ දුරුතු පුන් පොහෝදායි. සද්ධර්ම බලයෙන් අධර්ම බලය දුරු-වන්නේ පහනක් දැල්වූ කල ඒ අවට ඝන අන්ධකාරය දුරුවන්නාසේයි.

භෞතික විද්‍යාව අනුව ආලෝකය යනු භෞතික ශක්තියක්. එහෙත් අඳුර යනු භෞතික වශයෙන් ගතහැකි ශක්ති විශේෂයක් නොවෙයි. ආලෝක ශක්තියෙන් තොර තැනක ඇතිවන ස්වභාවයයි. ආලෝකයක් නැති හැම තැනකම ඇත්තේ අඳුරයි. අපට අඳුර දැනෙන්නේ භෞතික ශක්තියකින් ආලෝකය ආවරණය වුනාමයි. රෑ අඳුර යනු පොළවෙන් ඉර මුවා වූ කල ඇතිවන පොළවේ හෙවනැල්ලයි.

භෞතික වස්තුවක් නැති තැනක දහවල් කල ඇත්තේ ආලෝකයයි. අඳුර පමණක් ඇත්තේ සියළුම භෞතික වස්තූන් උරාගෙන ගිලගන්නා බ්ලැක් හෝල් නම් දැවැන්ත අන්ධකාර අගාධ වලයි. භෞතික කියන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා භූත ධර්මයන්ගෙන් නිර්මිතවූ දේට යි. අප දකින ආලෝකයත් භෞතිකයි එහෙත් රහතන් වහන්සේලා අත්දකින නිර්වානා ලෝකය අභෞතිකයි. බුද්ධත්ව යේදී ආලොකො උදපාදි වීය යනුවෙන් කියවෙන්නේ අභෞතික නිර්වානා ලෝකය උදාවූ බවයි. දුරුතු පුන් පොහෝ දිනක බුදුහිමියන් අධර්මාන්ධ කාරය දුරුකරමින් සිරිලක පැතිරුවේ ඒ නිර්වානා ලෝකයයි. සමන් දෙවියන් සෝවාන් වූයේ ඒ ආලෝක දර්ශනයෙනුයි.

නිර්වාණ ලෝකය ඉතාමත්ම සියුම් භෞතික ශක්ති විශේෂයක් වූ සිතට දැනෙන්නක්. භෞතික ආලෝකය භෞතික ඉන්ද්‍රියයන්ගෙන් සැදුණ ශරීරයට දැනෙන්නක්. අපේ ගත බොහෝ විට ලෙඩවන්නේ සද්ධර්මාලෝකය දුරුවී අධර්මාන්ධකාරය බිහිවූ විටයි. වෙන ලෙසකට කියතහොත් ගත ලෙඩවන්නේ කෙලෙස් මලින් සිත ලෙඩ වූ විටයි. සීතල වැඩිකමට ගත සිත දෙකම ලෙඩ වෙන අරුතෙනුත් දුරුත්ත හඳුන්වන්න පුළුවන්. ඒ දුරුතු යන වචනය හැදෙන්නෙ අශුභ නොහොත් නරක යන තේරුම දෙන **දු** යන උපසර්ගයත්, ඉරුතු යන යන පදයත් එක්වෙලයි. (දු + ඉරුතු = දුරුතු) ශාරීරික රෝග වැඩියෙන්ම වැළඳෙන්නෙත් ක්ලේශ ක්‍රමයෙන් අවදිවී සිත ලෙඩ වෙන්නෙත් දුරුත්තේ සීතලටයි. ඉන් වැලකීමට නම් මූලිකවම කළ යුත්තේ අසද්ධර්මාන්ධාකාරය දුරුකරන සද්-ධර්මා ලෝකය උදාකර ගැනීමයි.

සද්ධර්මාලෝකයෙන් අසද්ධර්මාන්ධ කාරය දුරුකිරීම ගැන පුරාවෘත්ත මගින් කියැවෙන්නේ බුදුහිමියන් සිරිලක් බිමට අරක්ගෙන සිටි යක්ෂයන් සිය සද්ධර්ම බලයෙන් ගිරි දිවයිනට පළවා හැරිය ලෙසයි. අපේ ගත ලෙඩකරන යකුන් වන්නේ කිපුණු වා, පිත්, සෙම් දෝසයි. අපේ සිත ලෙඩකරන යකුන් වන්නේ ලෝභ, ද්වේශ හා මෝහ යන ක්ලේශ මූලයි. අප තුළ අරක්ගෙන සිටින යකුන් ලෙස හැඳින්විය හැක්කේ මෝහාන්ධකාරය තුළ වැජඹෙන ලෝභ, ද්වේශ, ඊර්ෂ්‍යා, ක්‍රෝධාදී ක්ලේශ ධර්මයි. යකුන් දුරුකරගත හැක්කේ අප තුළ සද්ධර්මාලෝකය අවදිකර ගැනීමෙනුයි.

අපට අපේ ශාරීරික රෝග මෙන්ම අපේ චෛතසික ක්ලේශ දෝෂ නම් මානසික රෝග දුරුකළ හැක්කේ ඒවා අවදි වනවිට අවදියෙන් සිටීමෙනුයි. නරක සෘතුව යන තේරුම දෙන දුරුත්ත අපේ ශාරීරික හා මානසික දොස් ස්වාභාවිකව අවදිකරන මාසයක් නිසා දුරුත්ත කියන්නෙ ක්ලේශ ධර්මයන් දුරුකර ගැනීමට අවදියෙන් සිටිය යුතු මාසයක්.

♦ ***සම්මානිත මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*** **Harrow UK**



## බුදු හාමුදුරුවන්ගේ උපමා කතා

### ***ත්‍රිපිටක සාහිත්‍යයෙන්..........*** (එතෙරට ගොස් දමා යන්න)

“ මහණෙනි, මෙය හොඳින් අසාගන්න...!

මිනිහෙක් ගමනක් යාමට මගට බසී. ටික දුරක් යනවිට මහා ගං වතුරකි. රළ නංවමින් දිය කඳ ගලා බසී. එතෙර වීය නොහැකිය. කෙසේ හෝ එගොඩට යා යුතු ද වන්නේය. ඒ මිනිහා අතු කොළ වැල් කඩා පහුරක් බැන්දේය. එය දියට දමා, එහි එල්ලී, අතින් පයින් වෙර වීරිය කොට යාන්තම් එගොඩට පැන ගත්තේ ය.

මහණෙනි, දැන් එගොඩ වූ ඒ මිනිසා , මට මෙගොඩට ඒමට පිහිට වූයේ මේ පහුරය.... මෙය අතහැර දමා යන එක හොඳ නැත.... කරගහගෙන ගියොත් හොඳය....යි එය කරතබාගෙන යයි ද....? ”

“ නැත, ස්වාමීනි, කිසිම මිනිහෙකු එසේ කරන්නේ නැත. එගොඩ වූ පසු පහුර අත හැර දමා යනු ඇති.....”

“ මහණෙනි, මගේ ධර්මයද පහුරක් වැනිය. එය සසරින් එතෙර වීම පිණිස මිස කරගහගෙන යාම සඳහා නොවේ......! **( *මජ්ජිම නිකාය - කුල්ලූපම සූත්‍රය* )**

♦ ***පූජ්‍ය පොරවගම ඥාණසිරි හිමි - සුසිලාරාමය - බඹරවාන***

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතෝපදේශයෙන්

**ය: කුලාභිජනාචාරෛ ස රතිශුද්ධ: ප්‍රතාපවාන්**
**ධාර්මිකො නීතිකුශල: සස්වාමී යුජ්‍යතෙ භුවි**

***අර්ථය*** : *යමෙක් ලොවෙහි කුලසිරිත් හා ලෝ සිරිත් වලින් පිරිසිදුවේ ද, ඉතා තේජස් ඇත්තේ ද, ධාර්මික වේ ද, නීති ශාස්ත්‍රයෙහි දක්ෂයෙකු වේ ද, ඔහු ස්වාමිත්වයට හෙවත් රාජ්‍යත්වයට සුදුසු වෙයි.*

**මෙ**ම පද්‍යයෙන් රාජ්‍යත්වයට (රජකමට) සුදුසු පුද්ගලයෙකු සතුව තිබිය යුතු අනිවාර්ය ගුණාංග කීපයක් ඉදිරිපත් කරයි. **ඉන් පළමුවැන්න** ලෝ සිරිත් හා කුල සිරිත් වලින් පිරිසිදුවීමයි. මින් අදහස් කෙරෙන්නේ ලෝක සම්මත චාරිත්‍ර ධර්ම හා තම කුල පරම්පරාගතව යම් චාරිත්‍ර විධි ඇත්නම් ඒවා නොකඩා රැක ගැනීමයි. එහෙත් අද පාලක පක්ෂය හිතාමතාම විළිබිය නැතිව එම චාරිත්‍ර ධර්මයන් කඩා දමති.

හොඳ පාලකයෙකු සතු වියයුතු **දෙවැනි කරුණ නම්** ප්‍රතාපවත් බවයි. ආරෝහ පරිණාහ දේහයක් හෙවත් උසට සුදුසු මහත ඇති ඊට ගැළපෙන පෞරුෂයක් තිබීම පාලකයෙකුගේ ප්‍රතාපවත් බව ඔප කරන මෙවලම් වෙයි.

තේජවන්ත කෙනෙකු වීම **තෙවැනි කාරණයයි**. බියසුළු ගතිය, බයාදු ගතිය වැනි හීන ලාමක ගති පාලකයෙකුට තරම් නොවේ. විශේෂයෙන් රළු විය යුතු තැනදී රළුවීම මෘදු විය යුතු තැනදී මෘදුවීම ඉතා වැදගත් ය. හදවතින් මුදු මොළොක් කෙනෙකු ලෙස ද බාහිර පෙනුමෙන් ප්‍රතාපවත් තේජවන්ත බවක් පෙන්නුම් කරයි නම් ඔහුට තම පාලන කටයුතු කරගෙන යාමට පහසු වෙනවා ඇත.

**සිව් වෙනුව** සඳහන් වන ධාර්මික බව පාලකයෙකු සම්බන්ධයෙන් ඉතා වැදගත් කාරණයයි. රාජ්‍යයක හෝ මොනයම් ආයතනයක හෝ පරිපාලන බලය ක්‍රියාත්මක කරවන්නන් විසින් සුචරිතයෙහි පිහිටා කටයුතු කළ යුතු වන්නේ ය. පාලන ක්‍රියාවලිය ධර්මය මත පදනම් විය යුතුය. පාලකයා ධර්මය ඉක්මවා යමින් දුශ්චරිතයෙහි යෙදී අනුශාසනා කරන්නේ නම් එවන් රටක් හෝ ආයතනයක් කෙදිනක වත් දියුණුව කරා ළඟා නොවේ. එය දිනෙන් දින පිරිහීම කරා ළඟා වෙනවා ඇත. එසේ පාලනය කරන පාලකයින් නිසා සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන උරුමයන් හා හරයන් සෝදා පාළුවට පත් වේ. මෙහි සඳහන් වන අවසන් කාරණය පාලකයෙකු නීතිය දැන සිටීම හෙවත් නීතිගරුක වීමයි. නීතිය වල්වැදීම සියළු සමාජ ව්‍යසනයන්ට, සමාජ වියවුල් වලට හේතු වෙයි. යුක්තිය විචැරීමේ අප්‍රමාදීබව, නීතියෙහි සාධාරණත්වය සමාජ පාලනය අවුල් නොවීමට හේතූන්ය. නීතිය සාධාරණත්වය නොතකා කටයුතු කරන පාලකයන්ට හවුල් වන්නන් ද ඔවුන්ගේ සිතැහි පරිදි කටයුතු කරන්නට යෑමෙන් මුළුමහත් පාලන තන්ත්‍රයම බිඳ වැටේ. රට විනාශ වේ.

රජු රටේ හා ජනතාවගේ ආරක්ෂාව යහපත සැළසිය යුතුය. හොඳ පාලකයා හැම විටම බුද්ධිමත්ව කටයුතු කරන්නෙකි. හැම නායකයෙකුටම දක්ෂ පාලකයෙකු වීමට බැරිය. එසේම හැම පාලකයෙකුටම දක්ෂ නායකයෙකු වීමටද බැරි ය. එහෙත් දක්ෂ නායකයා හා දක්ෂ පාලකයා යන දෙදෙනම එක්කෙනෙකු වුවහොත් ඔහු කරන සේ-වයේ, දරණ තනතුරෙහි වටිනාකම හා ගෞරවය මනාව ආරක්ෂා වේ. නියම නායකයා නම් ඔහු ය. නියම පාලකයා නම් ඔහු ය.



♦ ***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 0 2 0 8 3 4 8 7 7 7 2**

**Work Permits and Highly Skilled Migrant Applications done.**
**We also deal with visa refusal from British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place, Colombo 7**
**Tel. 2672432 / 0777686632**